# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2032/32 - 2017 අගෝස්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2017.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 1933/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලදුව වරින්වර සංශෝධනය කරන ලද නිවේදනය, 2017 අගෝස්තු මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

(1) එම නිවේදනයෙහි විදේශ කටයුතු අමාත්‍ය (අංක 17) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(*අ*) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 4 සහ 5 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(*ආ*) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත (1997 අංක 20)" ඉවත් කිරීමෙන් ;

(2) එම නිවේදනයෙහි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය (අංක 8) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :

(*අ*) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 33 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

"34. ජාතික ලොතරැයි මණ්ඩලය
35. සංවර්ධන ලොතරැයි මණ්ඩලය"

(*ආ*) එහි III වැනි තීරුවෙහි "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12)" යන්නට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

"සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත (1997 අංක 20)"

08 - 1102

1A - G 26086 — 387 (2017/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*